# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2338/60 - 2023 ජුනි මස 30 වැනි සිකුරාදා - 2023.06.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

සපරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය - 2023

ඉහත සඳහන් උත්සවය 2023 ජූලි මස 16 වැනි දිනෙන් ආරම්භ වී 2023 අගෝස්තු මස 02 වැනි දින නිමාවට පත් වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

2019 නොවැම්බර් මස 26 දාතම හා අංක 2151/21 දරන *ගැසට් පත්‍රය.*

2020 ජූලි මස 17 දාතම හා අංක 2184/49 දරන *ගැසට් පත්‍රය.*

2021 අගෝස්තු මස 30 දාතම හා අංක 2243/8 දරන *ගැසට් පත්‍රය.*

2022 අගෝස්තු මස 18 දාතම හා අංක 2293/45 දරන *ගැසට් පත්‍රය.*

**වසන්ත ගුණරත්න,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
සපරගමුව මහ සමන් දේවාල ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2023 ජුනි මස 30 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39806 — 07 (2023/06)

මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සපරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය - 2023**

2019 නොවැම්බර් මස 26 දාතම හා අංක 2151/21 දරන *ගැසට් පත්‍රය*, 2020 ජූලි මස 17 දාතම හා අංක 2184/49 දරන *ගැසට් පත්‍රය*, 2021 අගෝස්තු මස 30 දාතම හා අංක 2243/8 දරන *ගැසට් පත්‍රය*, 2022 අගෝස්තු මස 18 දාතම හා අංක 2293/45 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පළ වූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනතාවගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධව පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

**01. පෙරහැර පවත්වන කාල සීමාව -**

- මෙවර සපරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2023 වර්ෂයේ ජූලි මස 16 වැනි දිනෙන් ආරම්භ වී අගෝස්තු මස 02 වැනි දින දිය කැපීමේ මංගල්‍යය සහ දහවල් පෙරහැරින් පසු අවසන් වන බව දැනුම් දෙමි.

| | | |
|---|---|---|
| * | සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය | 2023.07.16 |
| * | සාංඝික දානමය පිංකම | 2023.07.17 |
| * | කප් සිටුවීමේ මංගල්‍යය | 2023.07.18 |
| * | කඩතිම් වෙන්දේසිය | 2023.07.18 |
| * | කුඹල් පෙරහැර මංගල්‍යය | 2023.07.18 සිට 2023.07.22 |
| * | වීථි පෙරහැර මංගල්‍යය | 2023.07.23 සිට 2023.07.27 |
| * | රන්දෝලි පෙරහැර මංගල්‍යය | 2023.07.28 සිට 2023.08.01 |
| * | දිය කැපීමේ මංගල්‍යය | 2023.08.02 |

**02. කඳවුරු ප්‍රදේශය යනු -**

- *උතුරට :* වැසියන් පදිංචි පරවේනි නිලකරුවන්ගේ ඉඩම්, රථගාල් හා සල්පිල් භූමිය පෙන්වන සිමෙන්ති කාණුව හා රථගාලට ඇතුලු වන පාර ද, *දකුණට :* තෙන්නගේවත්ත හා කළු ගඟ ද, *නැගෙනහිරට :* රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගය ද, *බස්නාහිරට :* දේවාලය සතු මහ උයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ.

**03. වාහන -**

3.1 මාගේ හෝ බලයලත් නිලධාරියකුගෙන් හෝ ලබා ගත් අවසරයකින් තොරව, කිසිවකු විසින් මෝටර් වාහනයක්, බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන වෙන්කර ඇති රථගාල් පරිශ්‍රයෙන් හැර, වෙනත් කිසිදු ස්ථානයක හෝ උත්සව භූමිය තුළ නතර කර තැබීම හෝ ඇතුල් කිරීම නොකළ යුතුය.

3.2 රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල්කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

**04. ගොඩනැගිලි ඉදි කිරීම -**

4.1 මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ ලිඛිත අවසරයක් නොමැතිව, 2023 වර්ෂයේ ජූලි 16 වැනි දින සිට අගෝස්තු මස 02 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය තුළ යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අළුතින් කොටසක් එකතු කිරීම හෝ නොකළ යුතුය.

4.2 එසේ වුව ද, මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ හෝ නියෝග අතුරෙන්, යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක්, ගොඩැනැගීමක් සිදු කිරීමට අවසර ලැබෙනු ඇත.

**05. පෙරහැරට පුද පූජා පැවැත්වීම -**

5.1 දිය කැපීමේ පෙරහැර සඳහා පුද පූජා පැවැත්වීම පිණිස පෙරහැර අතර මග නැවැත්වීමට අවසර ඇත.

**06. සෞඛ්‍යය -**

6.1 යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ පවතින වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වගබලාගත යුතුය.

**07. වෙළෙඳාම -**

7.1 මාගේ හෝ බලයලත් නිලධාරින්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අත්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු අතර පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

7.2 කඳවුරු භූමිය තුළ දැනට පවත්නා මල්, පූජා භාණ්ඩ අළෙවි කරන වෙළෙඳ සැල් සහ කොටාඹේ අසළ සිට කැටලියන්පල්ලට පිවිසෙන මාර්ගය දක්වා ප්‍රධාන පාර දෙපස ඇති වෙළෙඳසැල් පෙරහැර පවත්වන කාල සීමාව තුළ රටෙහි පවතින සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට තරයේ වගබලා ගත යුතුය.

7.3 කඳවුරු භූමියට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට ඉදිකර ඇති මල් පූජා භාණ්ඩ අලෙවි සැල්වල මල් පූජා භාණ්ඩ අලෙවි කිරීම හැර කිසිවකු විසින් පූජා භූමිය තුළ කඩයක් තැනීම පවත්වාගෙන යාම, කිසිවක් වෙළෙඳාම් කිරීම නොකළ යුතුය.

7.4 සෑම ගොඩනැගිල්ලකම හා සෑම වෙළෙඳසැලකම කසළ බඳුනක් තිබිය යුතු අතර ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතුය.

7.5 විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණය සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතුය.

**08. යාචකයෝ -**

- හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමියෙන් පිටත වෙන්කර ඇති හෝ සපයනු ලැබ ඇති ස්ථානයන්හි දී මිස, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

**වසන්ත ගුණරත්න,**
රත්නපුර දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
සපරගමුව මහ සමන් දේවාල ඇසළ උත්සව කඳවුර භාර නිලධාරි.

2023 ජුනි මස 30 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.